චක්‍රලේඛ ලිපි අංක: 02 - 165 /2015

මගේ අංකය: HP/HI/Dir/AW/2015-04
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය
අමාත්‍යාංශය,
අංක 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ – 10.
2015.12.14

සියළුම සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (තෘතියික සත්කාර සේවා),
අධ්‍යක්ෂ (වෛද්‍ය සේවා),
අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය),
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම රෝහල් අධ්‍යක්ෂවරුන් / වෛද්‍ය අධිකාරීවරුන් / රෝහල් භාර වෛද්‍ය නිලධාරීන්,
සියළුම පෞද්ගලික රෝහල් ප්‍රධානීන්,

<u>මරණ ප්‍රකාශය (බී 33) සංශෝධනය කිරීම</u>

නව ජන්ම මරණ වාර්තාවීම අඩු වීමත්, මාතෘ මරණ තහවුරු කිරීමේදී ඇති වන ගැටළුත් සැළකිල්ලට ගෙන සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් විසින් දැනට පවතින මරණ ප්‍රකාශය (බී 33) සංශෝධනය කරන ලදී.

ඔබ ආයතනයේ සිදුවන, සජීවීව උපත ලබා පසුව මියයන නව ජන්මයින් ද (ගැබ් දැරීමේ කාලාන්තරය නොසළකා) ඇතුළුව, සිදුවන සියළුම මරණ සඳහා සංශෝධිත මරණ ප්‍රකාශය (බී 33) පෝරමය, පිටපත් තුනකින් යුතුව පිරවීමට මෙයින් උපදෙස් දෙනු ලැබේ. එහි පළමු පිටපත මරණකරුගේ ඥාතීන්ට ලබා දිය යුතු අතර, දෙවන පිටපත රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතුය. තුන්වන පිටපත කාර්යාල පිටපත වශයෙන් ඔබ ආයතනයේ තබා ගත යුතුය. අදාල සංශෝධිත මරණ ප්‍රකාශය (බී 33) පෝරම, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඔබ ආයතනය වෙත යථා කාලයේදී ලබා දෙනු ඇත.

ගර්භණී අවධියේ පසුවන හෝ ප්‍රසූතිය අවසාන වී මාස තුනක කාලයක් යනතෙක් සිදුවන, කාන්තාවකගේ මරණයක් මාතෘ මරණයක් ලෙස අනුමාන කෙරෙන බව තවදුරටත් දන්වා සිටිමි. එවැනි අවස්ථාවකදී, මරණ ප්‍රකාශය (බී 33) පිරවීමෙන් වැලකී, හදිසි මරණ පරීක්ෂණයක් සහ පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදුකිරීම සඳහා ඉල්ලා සිටින ලෙස ඔබට උපදෙස් දෙනු ලැබේ.

වෛද්‍ය. පී.ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

පිටපත: රෙජිස්ට්‍රාර් ජනරාල් - ඔබගේ දැනගැනීම හා ඉදිරි කටයුතු සඳහා